**තිරප්පනේ ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**-----------------------------------**

01. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 13 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුලි 22 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 04 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට තිරප්පනේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
----------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයට අදාළව 2020 වර්ෂයේ ගෙවීම්කර තිබුණු රු.220,480 ක් වූ වියදම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | වර්ෂයට අදාළ සියළු වියදම් ගිණුම්ගත කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | වටිනාකම අනාවරණය නොවූ සභාව විසින් භාවිතා කරනු ලබන වත්කම් අයිතම 07 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | වටිනාකම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ආ) නොසැසඳුනු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලේඛනය අනුව කර්මාන්ත ණයගැති වටිනාකම රු.36,642,858 ක් වුවද ශේෂ පත්‍රය අනුව වටිනාකම රු.37,434,887 ක් වු බැවින් රු.792,029 ක වෙනසක් තිබුණි. | ගිණුම් පිළියෙල කිරීමේදී ලේඛන තුලනය කර සැසඳීම කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලේඛනය අනුව කර්මාන්ත ණයහිමි වටිනාකම රු.38,387,891 ක් වුවද ශේෂ පත්‍රය අනුව රු.38,630,296 ක් වු බැවින් රු.242,405 ක වෙනසක් තිබුණි. | ගිණුම් පිළියෙල කිරීමේදී ලේඛන තුලනය කර සැසඳීම කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(i) ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂ 04 සිට 05 දක්වා කාලයක සිට පැවත එන රු.830,966 ක ලැබිය යුතු ශේෂ 06 ක් අයකරගෙන නොතිබුණි. | මෙම ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | සාක්ෂි සොයාගත නොහැක. පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබාගෙන නිවැරදි කරමි. |

(ii) ගෙවිය යුතු ගිණුම්

| | | |
|---|---|---|
| වර්ෂ 04 සිට 05 දක්වා කාලයක සිට පැවත එන රු.238,217 ක ගෙවිය යුතු ශේෂ 02 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | වටිනාකම රු.72,422,421 ක් වූ ගිණුම් විෂයයන් 12 කට අදාලව පිලිගත හැකි සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි. | මූලා‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | පිළිගනිමි |
| (ii) | 2016 වර්ෂයේ වැඩියෙන් බිල්කිරීම් ජ'නල සටහන් මගින් මෙම වර්ෂයේ සමුච්චිත අරමුදලට ලියාහැර තිබුණු හිඟ කඩ කුලී රු.593,409 ක් සම්බන්ධ තහවුරු තොරතුරු ඉදිරිපත් නොකෙරුණි. | අදාළ ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | විස්තරාත්මක උපලේඛන සොයාගත නොහැක. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ මූලා‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.1,129,950 ක්වූ යන්ත්‍රෝපකරණ, රු.1,077,400 ක්වූ මෝටර් රථ හා කරත්ත, රු.418,939 ක් වූ ලී බඩු හා සවිකිරීම්වල සහ රු.68,764,403 ක්වූ ඉඩම් හා ගොඩනැගිලිවල භෞතික පැවැත්ම තහවුරු කරගෙන නොතිබුණි. | අදාල තොරතුරු හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වේ. | විස්තරාත්මක උපලේඛන සොයාගත නොහැක. |

1.4 අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

| | නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන විගණන පනතේ 16(2) උපවගන්තිය | සමාලෝචිත වර්ෂයේ කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කළ යුතුවේ. | ගිණුමේ ඉටු කළ කාර්යයන් දක්වා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති සංග්‍රහය<br>----------------------<br>iii පරිච්ඡේදයේ රීති 33 | වරිපනම් ගෙවීම පැහැරහරින පුද්ගලයන් පිළිබඳව ලැයිස්තුවක් සහ දේපල තහනම් කිරීමේ වරෙන්තු එක් එක් කාර්තුව අවසානයේදී පිළියෙල කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අදාළ ලයිස්තු කාර්තු අවසානයේදී පිළියෙල කිරීමට කටයුතු කරමි. |

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.117,700 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.928,671 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කල ආදායම | රැස්කල ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් බදු | 1,180,358 | 1,251,375 | 1,368,643 | 618,354 | 1,141,878 | 1,147,957 | 1,132,622 | 735,622 |
| (ii) | කුලී | 3,994,600 | 4,406,290 | 5,141,991 | 656,646 | 4,568,450 | 3,245,355 | 3,466,439 | 1,392,347 |
| (iii) | බලපත්‍ර ගාස්තු හා සේවා | 3,538,500 | 3,501,910 | 1,801,910 | 1,766,040 | 2,237,460 | 1,528,185 | 1,528,185 | 66,040 |
| (iv) | වෙනත් ආදායම් | 23,889,332 | 19,437,943 | 19,392,309 | 3,100,937 | 23,753,771 | 20,192,863 | 19,610,441 | 3,055,303 |
| | | 32,602,790 | 28,597,518 | 27,704,853 | 6,141,977 | 31,701,559 | 26,114,360 | 25,737,687 | 5,249,312 |

2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගේ සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.1,141,333 හා මුද්දර ගාස්තු රු.1,779,650 ක් විය. | අදාළ හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පළාත් ආදායම් දෙපාර්තමේන්තුව වෙතින් ලැබෙන උපලේඛන මත හිඟ ප්‍රමාණය අයකර ගැනීමට කටයුතු කරමි. |

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යන් ඉටුකිරීම පිළිබඳව වු නිරීක්ෂණය වු කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු නමුත් 2019 දෙසැම්බර් 31 දිනට අදාළ කාරණා සම්බන්ධව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කළ යුතු වේ. | 1988.08.23 වන දින 520/02 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයේ සඳහන් අතුරු ව්‍යවස්ථා 42 ක්, 2001.03.21 දින අංක 1.177 හා 2017.06.09 වන දින 2022/32 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද අතුරු ව්‍යවස්ථා 10 ක් 2019.02.15 දින අංක 1960/35 අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් වැළඳගෙන කටයුතු කරගෙන යනු ලැබේ. |

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත් වී තිබුණු අතර අරමුණු ඉටුකර ගැනීම සඳහා වැඩසටහන් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක පිහිටුවා ක්‍රියාත්මක කළයුතු වේ. | තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත් වී තිබුණු අතර අරමුණු ඉටුකර ගැනීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සංචාරක සංවර්ධන පනත යටතේ ලියාපදිංචි හෝටල, ආපනශාලාවල හෝ නවාතැන්පළවල් වලින් 2017 සිට 2019 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් ලැබිය යුතු බලපත්‍ර ගාස්තු අයකර ගෙන නොතිබුණි. | ලැබිය යුතු බලපත්‍ර ගාස්තු අයකිරීමට කටයුතු කළයුතු වේ. | බදු මුදල් ගණනය කර අයකරගැනීමට කටයුතු කරමි. |

3.3 වත්කම් කළමනාකරණය

3.3.1 පවරානොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභාව විසින් පරිහරණය කරනු ලබන රු.1,000,000 ක් වූ වාහනයේ අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ වාහන පවරා ගැනීමට කටයුතු කළයුතු වේ. | 252 -6495 - කැබ් රථය - රු.1000,000 - පවරා ගැනීමට අවශ්‍ය මූලික කටයුතු සිදුකර ඇත. |

3.3.2 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභා පරිශ්‍රයේ රඳවා තිබෙන අක්‍රීය තත්ත්වයේ පැවති වාහන 06 ක් අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | අළුත්වැඩියා කිරීම හෝ චක්‍රලේඛය ප්‍රකාරව අපහරණය කිරීම සිදු කළයුතු වේ. | 270-3339 - ට්‍රැක්ටරය භාවිතයට ගත නොහැකි නිසා යාන්ත්‍රික ඉංජිනේරු නිර්දේශය මත ප්‍රධාන ලේකම් වෙත භාරදීමට හා GI – 0107 - මෝටර් සයිකලය සහ තණකොළ කපන යන්ත්‍ර දෙක භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ මත ද කටයුතු කරමි.<br><br>JF – 8666- ත්‍රීරෝද රථය විශාල අළුත්වැඩියාවක් කළ යුතු බැවින් ඒ සඳහා අධික පිරිවැයක් දැරීමට අපහසුය. |

3.3.3 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයට අයවැයගත කර තිබුණු ඇස්තමේන්තු වටිනාකම රු.979,327 ක් වූ හල්මිල්ලකුලම මාර්ගය සංවර්ධනය කිරීම ඉටුකර නොතිබුණි. | අදාළ ව්‍යාපෘති ඉටුකිරීම සභාවේ වගකීම වේ. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති කාලය අවසන් වනතුරුත් කිසිම කොන්ත්‍රාත් සමිතියක් ඉදිරිපත් නොවූ බැවින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. |

04. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| උතුරු මැද පළාත් පාලන කොමසාරිස්ගේ 2015 මාර්තු 18 දිනැති අංක 04/2015 දරන චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව සෘජුවම වගකියනු ලබන අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත්කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී අභ්‍යන්තර විගණන වාර්තා සකස්කිරීමට අදාල විෂය නිළධාරී වෙත උපදෙස් ලබා දුනි. |